නිරෝධය

ශ්‍රී ලංකාරාමය - නවසීලන්තය

21.03.21

අද මම මේ පින්වතුන්ට පොඩි කාරණයක් කියලා දෙනවා. ඒ තමයි **නිරෝධය** කියන වචනය. නිරෝධය කියන වචනය සූත්‍ර දේශනා වල තිබෙනවා. අද අපි ඒක තේරුම් ගන්න උත්සාහ කරමු. අද මේ කියලා දෙන්නා වූ ධර්ම පදය ධර්ම කාරණය ඉතාමත් පැහැදිලිව පිරිසිදුව ඉතාමත්ම හොඳින් සැම දෙනාටම තේරුම් ගන්න ශක්තිය ලැබේවා! සිහිය නුවණ වැඩේවා! යෝනිසෝමනසිකාරය ප්‍රඥාව අවධි වේවා! මේ ධර්ම කාරණා හැම දෙනාටම ඉතාමත්ම පැහැදිලිව හොඳින් අවබෝධ කරගෙන ඒ තුලින් නිර්වාණ ධාතුව ස්පර්ශ කරන්න ලැබේවා කියලා මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා.

'නිරෝධය' - මේ නිරෝධය කියන එකේ තිබෙනවා අවස්ථා කීපයක්. මේ නිරෝධ කියන වචනය හැදිලා තිබෙන, රෝධ කියන වචනයේ තේරුම 'පවතිනවා' 'කැරකෙනවා' 'ඉස්සරහට යනවා' කියන එකයි. **නිරෝධ** කියලා කියන්නේ ඉස්සරහට පවතින්නේ නෑ, පවතින දෙයක් තිබෙනවා නම් එය නැති වෙනවා, බිඳෙනවා, මැරෙනවා කියන එකයි. ඒක තමයි ඒ නිරෝධ කියන වචනයෙන් අදහස් කරන්නේ.

මේ නිරෝධය කියන වචනය පාවිච්චි කරපු ගැඹුරු තැනක් තිබෙනවා. දුක්ඛ නිරෝධය කියලා දේශනාවේ තැනක තිබෙනවා. මේක මේ පින්වතුන් උත්සාහයෙන් තේරුම් ගන්න. 'විරාගය' 'නිරෝධය' 'නිබ්බාන' කියලා වචන තුනක් තිබෙනවා. නිරෝධය කියලා කියන තැන තිබෙන්නේ නැති වෙලා, නැති වෙලා ගිහිල්ලා සම්පූර්ණයෙන්ම නැති වෙන එකක්. ඒක හරි බලවත් වූ නිරෝධයක්. ඊට මෙහා පැත්තේ සිදුවන පොඩි පොඩි නිරෝධ තිබෙනවා. ඒවටත් අපි නිරෝධය කියලා කියනවා.

1) **ක්ෂණ නිරෝධය** - ක්ෂණයකින් කැඩී බිඳී නැතිවී යෑම.

මේ ක්ෂණයකින් සිද්ධවන නිරෝධ අපි දන්නෙත් නෑ. අපිට තේරෙන්නෙත් නෑ. ඒක ඒ තරමම quick.

2) **සන්තති නිරෝධය** - කාලයක් තිබිලා නැති වී යෑම.

ඒක ටික කාලයක් තිබිලා නැතිවෙනවා. ඒකත් නිරෝධයක් තමයි. ගහක් අවුරුදු 10 තිබිලා මැරිලා ගියා. ඒ කියන්නේ ඒ ගහ දැන් පවතින්නේ නෑ. ඒකත් නිරෝධයක්. සමහර ඒවා අවුරුදු 1000 ක් තිබිලා නැති වෙලා යනවා. සමහර වස්තු තිබෙනවා එක්තරා කාල ප්‍රමාණයක් තිබිලා එහෙමම නැතිවෙලා යනවා, අභාවයට පත්වෙනවා. ඒවටත් කියනවා නිරෝධය කියලා. 'භව' කියන්නේ පවතිනවා. 'අභාව' කියන්නේ නොපවතින තත්වයට පත්වෙනවා. අපේ මනුස්ස ජීවිතෙත් එක්තරා කාලයක් තිබිලා නැතිවෙලා යනවා. නිරුද්ධ වෙලා යනවා. ස්වාමීන්වහන්සේ කෙනෙක් ගත්තත් මහණ කමත් එක්ක ඒ ජීවිතය පැවතිලා, පවතින්නේ නැති තත්වයට පත් වෙනවා. එතකොට අපවත් වෙනවා කියලයි කියන්නේ. ඒ ජීවිතෙත් නිරෝධවෙලා ගියා. මේ දේවල් කාලයක් තිබිලා නැතිවන දේවල්.

මේ නිරෝධ දෙකම නිවන නොවෙයි.

3) **අනුත්පාද නිරෝධ** - නැවත නූපදින ලෙස වන විරුද්ධ වීම

අපි නිවන් අවබෝධ කරගන්න වේලාවේදී නැතිකරන්නේ තිබෙන කෙලෙස්ද නැති කෙලෙස්ද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. දැන් අපිට කොරෝනා වලට බෙහෙත් ගහනවා. කොරෝනා හැදිච්ච අයටම නොවෙයි ඒක දෙන්නේ. කොරෝනා හැදිච්ච නැති අයටත් දෙනවා. කොරෝනා හැදිච්ච අයට ඒ vaccination එක දුන්නහම ඒකෙ තිබෙනවා පිළිගන්න පුළුවන් ගතියක්. නමුත් ඒ vaccine එක ලෙඩේ නැති අයටත් දෙනවා. හැදිච්ච අයට ඒක දෙන්නේ හැදිච්ච එක නැති කරගන්නයි. හැදිච්ච නැති අයට දෙන්නේ හැදිච්ච නැති ලෙඩක් හැදෙන්නේ නැතුව පවත්වාගන්නයි. හැදිච්ච නැති එක්කෙනාට තවම ඒ ලෙඩේ ඉපදිලා නෑ, නමුත් ඒ vaccine එක දීපු ගමන්ම ඒ ලෙඩේ එන්නේ නෑ.

ඒවගේ නිවන් අවබෝධ කරගන්න වෙලාවේදී ඒ වෙලාවට ක්‍රියාත්මක වෙලා නැති නමුත් ඉස්සරහට ක්‍රියාත්මක වෙන්න පුළුවන් කෙලෙස් ටිකක් තමයි නැති කරන්නේ, අර vaccine එක වගේ. මේක ගැඹුරු දෙයක් තේරුම් ගන්න සාමාන්‍ය උදාහරණයක්, උපකාරක වස්තුවක් පමණයි. හොඳට හිතලා බලන්න නිවන් දකින අවස්ථාවේදී නැති කරන්නේ තිබෙන කෙලෙස්ද කියලා. නිවන් දකින අවස්ථාවේදී කෙලෙස් නෑ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ඉස්සරහ පිට කෙනෙක් බණ අහන වෙලාවේදී එයාගේ හිතේ කෙලෙස් නෑ. බුදුරජාණන්වහන්සේ කෙරෙහි පැහැදිලා ශ්‍රද්ධාව මතු කරගෙන උන්වහන්සේ දිහා බලාගෙන හිත අවධි කරමින් ධර්මය තේරුම් කරමින් යනකොට ධම්මවිචයසම්බොජ්ඣංග හොඳින් වැඩ කරනවා, ක්‍රියාත්මක වෙනවා. සති සම්බොජ්ඣංගය හොඳින් වැඩ කරනවා, ක්‍රියාත්මක වෙනවා. වීර්ය හොඳට අවධි වෙලා තිබෙනවා. ඒවගේම සතුටක් ප්‍රසාදයක් තිබෙනවා. සිත කොහෙවත් දුවන්නේ නෑ, චිත්ත ඒකාග්‍රතාවය හරිම හොඳයි. මේ ධර්ම ටික ඔක්කෝම තිබෙනකොට එතැන කෙලෙස් නෑ. එතැන කෙලෙස් හිටින්න බෑ. කෙලෙස් තිබෙනවා නම් බණ තේරුම් ගන්න බෑ. කෙලෙස් වලින් වැහිච්ච හිතකට කෙලෙස් වලින් මුලා වෙච්ච හිතකට, කෙලෙස් වලින් අඳුරු වෙච්ච හිතකට කිසිසේත්ම ගැඹුරු ධර්මයක් වැටහෙන්නේ අවබෝධ වෙන්නේ නෑ. ඒ වෙලාවට මේ කෙනාගේ හිතේ ධම්මවිචය බොජ්ඣංගය තිබෙනවා, සති බොජ්ඣංගය තිබෙනවා, පීතිය තිබෙනවා, විරිය තිබෙනවා, පස්සද්ධි ගුණය, ඒකාග්‍රතාව කියන මේ ටික ඔක්කොම තිබෙනවා.

එතකොට බණ ඇසීමේදී බණ හිතීමේදී මෙනෙහි කිරීමේදී පහළවන කුසල් සිත්ටික යම්කිසි විදියකින්වත් නැවතුනොත් නැවත මතු වෙන්න පුළුවන් ක්ලේශයෝ තමයි ඒවෙලාවට නැති වෙන්නේ. දෘෂ්ඨිය නැවත මතු වෙන්න පුළුවන්. මානය එන්න පුළුවන්. සක්කාය දිට්ඨිය නැවත මතුවෙන්න පුළුවන්. තණ්හාව එන්න පුළුවන්. දැනට ක්‍රියාත්මකවන කුසල් සිත්ටික අඩාල වෙලා යටගිය ගමන් අකුසල් මතුවෙන්න පුළුවන්. ඒ possibility එක තියෙනවා. එතකොට ලෝකෝත්තර ධර්ම අවබෝධ කරගන්නකොට වෙන්නේ ඒ වෙලාවට ක්‍රියාත්මක වෙන්නේ නැති නමුත් මතුවට ක්‍රියාත්මක වෙන්න පුළුවන් කියලා සැලකිය හැකි ධර්ම ටිකක් නැවත මතු නොවන ආකාරයට වළක්වන එකයි. අපි කියනවා නිවන් දැක්කහම සියලු කෙලෙස් නැති කළා කියලා. නමුත් අපි ඒ වෙලාවට කරන්නේ නිදාගෙන හිටපු කෙලෙස් ටික එහෙමම නැති වෙන්න ඇරලා ධර්ම අවබෝධ කරගැනීමක්. කෙලෙස් නැවත උපදින්නේ නැති වෙන්න නිරුද්ධ කරන එකට කියනවා **අනුත්පාද නිරෝධය** කියලා.

තවත් විදියකට කියනවා නම් ඉපදිලා නැති කෙලෙස් නැවත නූපදින විදියට නැති කරනවා නම් ඒකට කියනවා **අනුත්පාද නිරෝධය** කියලා. **උප්පාද නිරෝධය** කියලා කියන්නේ හටගත්ත දෙයක, පැවතිච්ච දෙයක නැතිවීමයි. මේ වැඩේ කරන්න අපි හැම දෙනාම උත්සාහ කල යුතුයි. ඒකෙන් එකක් තමයි භාවනාව. ඒවගේම මෙනෙහි කිරීම, බණ ඇසීම, සාකච්ඡා කිරීම නුවණ උත්පාදනය කරන දේවල්.

මම කිව්වා කරුණු තුනක් හිතන්න ඕනෑ කියලා. එකක් තමයි නිත්‍ය නැති කඩා හැලෙන ගතිය. ඒ නිත්‍ය නැති කැඩී යන බිඳී යන ගතිය තිබෙන තැනක් තිබෙනවා. නිත්‍ය නෑ කියලා කියන්නේ කඩා වැටෙනවා, පවතින්න බෑ කියන එකයි. පවතින්නේ නැත්තේ කඩා බිඳෙන නිසයි. බුදුරජාණන්වහන්සේ ගැඹුරින්ම හොයාගත්ත දෙයක් තමයි මේ නැතිවී යන ගතිය. යම්කිසි දෙයක් ඇති උනානම් යම්කිසි දෙයක් හැදුනානම් ඒ ඇතිවෙච්ච දේක, හටගැනීම තිබෙන තැනක තමයි නැතිවීම තිබෙන්නේ. ඇතිවීමක් නැති තැන නැති වීමක් හිටින්නේ නෑ. මේ ගැන කියනකොට 'මේක පොඩි දෙයක්' කියලා හිතුනට මේක හරි ගැඹුරුයි. නැති වීමක්, නිරෝධයක්, වෙනස් වීමක් තියෙන්නේම හටගත්ත දෙයකයි. එහෙම නැත්නම් ඒක නෑ.

නිවන් දැක්කහම මොකක්වත් නෑ. රූප ගතියක් මොකක්වත් නෑ. වායෝ ගතියක් කිසිම දෙයක් නෑ. නිර්වාණ ධාතුව කියන එකේ සංඛත වශයෙන් පවතින කිසිම දෙයක් නෑ. මේ රූප, පරම්පරාවෙන් පරම්පාරවට අරගෙන ඇවිල්ලා අවසාන කාර්තුවේ තිබෙන ටික තමයි දැන් මේ තිබෙන්නේ. අතීතයේ කොච්චර නම් මේ වගේ උසරූප කළුරූප සුදුරූප මධ්‍යම තලළුලු වගේ රූප තිබිලා දැන් වර්තමානයට තිබෙන්නා වූ ගතියක් තමයි මේ තිබෙන්නේ. ඒ රූප මුල් කරගෙන අපි කොච්චර දේවල් හිතලා ඇත්ද. ඒ ඇඟවල් මුල් කරගෙන කොච්චර සතුටක් සොම්නසක් විඳලා ඇතිද. නමුත් දැන් මේ තිබෙන්නා වූ රූප ටික කවදාහරි දවසක නැතිවෙනවා.

පඨවි ගතියත් නැතුව ආපෝ තෙජෝත් නැතුව ආයතන කියන කිසිම දෙයක් පිහිටන්නේ නැතුව නැවතත් ශරීරයක් හටගන්නේ නැතුව නැත්තටම නැතිවෙලා ගියානම් ඒ ගැන ශාන්තියක් දැනෙනවද? භයක් හිතෙනවද? ඇත්තටම සමහරුන්ට භයක් හිතෙනවා. ඒ භය එන්නේ ඇයි? ඒ භය එන්නේ, අපිට නොදැනුවත්වම මේ කයට තිබෙන ආසාව බැඳීම නිසයි. ඇයි මේ ශරීරයට අපි උපාදානය වෙලා තිබෙන්නේ? මේකේ තිබෙන්නා වූ නියම ස්වභාවය අපිට හරියාකාරව තේරෙන්නේ නැති නිසා. ඒක නිසයි බුදුරජාණන්වහන්සේ දේශනා කළේ මේ ශරීරයේ තිබෙන යථා ස්වභවය තේරුම් ගන්න කියලා. මේ ශරීරයට ඉපදීමක් තිබුණා. ඉපදීමක් තිබුණ තැන නේද කඩා වැටීම වෙනස් වීම තිබෙන්නේ. ඉපදීමක් නැති තැන කඩා වැටීමක් නෑ.

ඔය සම්මර්ශන ඤාණය කියන තැන අපි මෙහෙම කථාවක් කිව්වා. ඒ තමයි **ජාති පච්චයා ජරා මරණන්ති ඤාණං**; ඉපදීම කියන්නා වූ ධර්මය තිබුනොත් පමණයි ජරාව හෙවත් දිරා යෑම සහ මරණය යන දෙක තිබෙන්නේ. ඉපදීමක් නැති තැන දිරායාමක් නෑ. ඉපදීමක් නැති තැන මරණයක් නෑ. මේක අපිට මේ විදියට ලඟතැනකින් තේරුම් ගන්න පුළුවන්.

අපි හිතමු ලොකු බල්ලෙක් මැරිලා කුණු වෙලා පණුවෝ ගහලා ගඳ ගහනවා කියලා. ඒ පණුවෝ ගහන ගතිය ගඳ ගහන ගතිය මැරෙන ගතිය කුණුවෙන ගතිය ඇති උනේ ඉපදීමේ ගතිය තිබුණ තැනකටයි. බල්ලෙක් හැටියට ඉපදුන ගතියක් තිබුණා. අපි හිතමු ඒ බල්ලා හිටියේ ගහක් යට කියලා. ඒ බල්ලගේ ඉදිමිච්ච ශරීරයේ ප්‍රමාණයට එතැන **අහස** ටිකක් තිබෙනවා. ඒ බල්ලා කුණු උනහම ඒ ලේ සැරව ඒ ගහේ ගෑවෙනවා. මුල් වල ගෑවෙනවා. තණකොළ වල ගෑවෙනවා. නමුත් ඒ බල්ලා හිටපු තැන අහසේ ජරාව ගෑවෙන්නේ නෑ. නමුත් ඒ තැවරීම සිද්ධ උනේ ගහේ, ඒ තැවරීම සිද්ධ උනේ මුලේ, ඒ තැවරීම සිද්ධ උනේ තණකොළ වල. මේ ලේ කුණප අහසේ ගෑවෙන්නේ නෑ. හේතුව, ඒ ධර්මතා දෙකේ වෙනසක් තිබෙනවා.

ගහ කියන එක හේතුවෙන් හටගත්ත එකක්. ඒක සංඛතයි. මුල් කියන ඒවත් හේතුවෙන් හටගත්ත දේවල්. ඒවත් සංඛතයි. තණකොළ කියන දේවල් සංඛතයි. අහස කියන එක හේතුවෙන් හටගත්ත දෙයක් නොවෙයි. ඒක නිසා තමයි එහෙම වෙන්නේ. ඒ වගේ කොච්චර මිනිස්සු නිවනට ගියත් කවදාකවත් නිවන පිරෙන්නේ නෑ. ඒ තරමටම නිවිච්ච ගතියක් නිවනේ තිබෙන්නේ.

නිවන කියන එක අහස වගේ එකක් නොවෙයි. නමුත් නිවන මෙන්න මෙහෙමයි කියන එක තේරුම් ගන්න අපේ මට්ටමෙන් භාවිතා කරන්න පුළුවන් තරමේ ධර්ම ස්වභාවයක්. අනිත් එක තමයි අහස කියන එක පැන පැන යන එකකුත් නොවෙයි. ඒක ඒ විදියටම පවතිනවා. ඒක සුදුත් නෑ කළුත් නෑ උසත් නෑ. ආකාස ධාතුව ඒ විදියටම පවතිනවා. නිර්වාණ ධාතුවත් හරිම ශාන්තයි. හරිම පිවිතුරුයි. නිර්වාණ ධාතුවේ පාටක් වර්ණයක් මොකක්වත්ම නෑ. ඒකෙ මාන්නය හැදෙන්නේ නෑ. මාන්නය හැදෙන්නේ නැත්තේ නිවනේ මනින්න දෙයක් නැති නිසා. යම්කිසි දෙයක් මනින්න නම් මනින්න වෙන්නේ කෙලෙස් වශයෙන් හෝ උස මහත වශයෙන්. ඒක හේතුවකින් හටගත් දෙයක් වෙන්න ඕනෑ. දැන් මිනිස්සු බර වශයෙන් මනිනවා, උස වශයෙන් මනිනවා, පාට වශයෙන් සලකා ගන්නවා, මහත වශයෙන් මනිනවා. නමුත් නිවනේ මහතත් නෑ, උසත් නෑ.

මේ විදියට හිතලා බලන්න. බ්‍රහ්මලෝකයේ ඉන්න බ්‍රහ්මයන්ටත් සමහර කාල වලට පාළුයි කියලා හිතෙනවලු. බ්‍රහ්මයෝ බ්‍රහ්මලෝකේ ඉඳලා ඉඳලා බොහෝම කල් හිටියට පස්සේ බ්‍රහ්මයන්ට හිතෙනවලු 'හරිම පාළුයි, මම වගේ තව එක්කෙනෙක් වත් හිටියොත් හොඳයි' කියලා. එහෙම හිත හිතා ඉන්නකොට පස්සේ කාලයකදී වෙන බ්‍රහ්මයෙක් වෙන තැනක ඉඳලා එතැන පහළ වෙනවලු. මේ දෙන්නා සාකච්ඡා කරාට පස්සේ ඉස්සෙල්ලා හිටපු බ්‍රහ්මයා හිතනවලු ඒ දෙවැනි බ්‍රහ්මයා ආවේ මම හිතපු නිසා, ඒක නිසා එයා හිතා ගන්නවලු 'ඒ බ්‍රහ්මයා හැදුනේ එයාගේ හිතින් නිසා මම තමයි ලොක්කා' කියලා. දෙවනියට ආපු බ්‍රහ්මයා හිතාගන්නවලු 'මම මෙහෙට එන්න කලින් මෙහෙ හිටියේ අනිත් බ්‍රහ්මයා, ඒක නිසා එයා තමයි ලොක්කා' කියලා. සූත්‍ර දේශනා විස්තර කරනකොට මේ විස්තර තිබෙනවා. ඔහොම ඔහොම යනකොට පස්සේ ආපු බ්‍රහ්මයෝ ගෝලයෝ වෙනවා ඉස්සෙල්ලා ආපු බ්‍රහ්මයා master වෙනවා. ඉස්සෙල්ලා ආපු ඒ බ්‍රහ්මයාට මහා බ්‍රහ්මයා කියලා කියනවා.

දැන් හිතලා බලන්න බ්‍රහ්මයන්ටත් කාලයකදී ඇතිවෙනවා පාළුවක්. නිවන් දැක්කට පස්සේ පාළුයි කියලා හිතෙන්නේ නෑ. නමුත්, ඇයි එහෙම වෙන්නේ නැත්තේ කියලා අපි මේ විදියට බලමු.

අපිට යම්කිසි දෙයක් හිතන්න අවශ්‍ය නම් එසේ සිතීමය අවශ්‍ය tools ටිකත් තිබෙන්න ඕනෑ. අපිට යම්කිසි දෙයක් කෙරෙහි කලකිරෙන්න හරි, සතුටු වෙන්න හරි, අඬන්න හරි, තරහ ගන්න හරි, මාන්නය ඇති කරගන්න හරි මොකක් හරි දේකට අවශ්‍ය toolset එකක් තිබෙනවා. ඒ තමයි චිත්ත චෛතසික. සිතින් චින්තනය කරන්න ඕනෑ. සිතට විතරක් තනියම බෑ. එහෙට මෙහෙට හැරෙන්න අරමුණට ගොඩ වෙන්න චෛතසිකත් අවශ්‍යයි. යම්කිසි දෙයක් ගැන කලකිරෙන්නත් චිත්ත චෛතසික ධර්ම අවශ්‍යයි. හොඳ විදියට කලකිරෙන්න ප්‍රඥාව අවශ්‍යයි. සමාන්‍ය ජීවිතියේදී ගෙවල් දොරවල් පිළිබඳ කලකිරෙන්නේ ද්වේශයෙන්. ඒකට ද්වේශය අවශ්‍යයි.

ඒවගේම අනාගතය ගැන හිතන්න විතර්ක කරන්න ලෝභ කරන්න tools අවශ්‍යයි. මේ සංසාරයේ වැඩ කරන්නේ චිත්ත චෛතසික පරම්පරාවක්. චිත්ත චෛතසික පරම්පරාවක් රූප කයකට සම්බන්ධ වෙලා ක්‍රියාත්මක වෙවී එහෙ ගැන හිතනවා, මෙහෙ ගැන හිතනවා, දුර බලනවා, ළඟ බලනවා, අහනවා වගේ වැඩ කර කර ඉන්නවා. ඔය ක්‍රියාව දිගටම කෙරෙමින් පවතිනවා. මේක දිගටම යනනිසා පවතින නිසා කියනවා **රෝධය** කියලා.



අපි හිතමු කෙනෙක් නිවන් දකිනවා. මේ ශරීරයට shape එකක් තිබෙනවා. නමුත් ඒ shape එක, ඒ ශරීරය නිවනේ නෑ. ඒක නිසා ඒකෙ මහතක් නෑ. ඒකෙ බරක් නෑ. පඨවි ගතිය නෑ. ඒ body එක නිවනේ නැති හින්දා පාටක් කියන්න බෑ. එක නිසාම 'අරයා මට වඩා උසයි. පාටයි' කියලා මනින්න බෑ. එහෙම මනින්නේ මානයෙන්. ඒක චෛතසිකයක්. නිවනේ ඒක නෑ. නිවනට මෙහා පැත්තේ ඒ ඔක්කොම දේවල් තිබෙනවා. උස මනින්න පුළුවන් හැම දේම පුළුවන්. නමුත් නිවන් දැක්කට පස්සේ චිත්ත චෛතසික ඒ වගේම ශරීරය ඔක්කෝම ටික නැතිවෙලා යනවා. ඒ සියල්ල නැතිවෙලා යනකොටම ඉතුරු වෙන්නේ නිවීම. ඒ සියල්ල නැතිවෙලා යනවා කියලා කියන්නේම දුකින් නිදහස් උනා, නිවීම ඇති උනා කියන එක.

චිත්ත චෛතසික ඒ වගේම ශරීරය කියලා කියන්නේ දුක් නිෂ්පාදනය කරන තැන්. චිත්ත චෛතසික වලින්ම හදාගත්ත එකක් තමයි මේ ශරීරය. ඒක තමයි **රෝධ** ගතිය. නමුත් නිවනට යනකොට ඒ සියල්ල **නිරෝධයි**.

හොඳට හිතලා බලන්න, 'නිවන නම් හොඳයි, ඔය කියන හැටියට නිරෝධය හොඳයි ශාන්තයි වගේ පේනවා. නමුත් නැත්තටම නැතිවෙලා යන නිසා ටිකක් පරක්කු උනාට කමක් නෑ' කියන අදහස කෙනෙකුට ඇතිවෙන්න පුළුවන්. එහෙම වෙන්න හේතුව තමයි නිවනට මෙහා පැත්තේ තිබෙන දේවල් වලට තිබෙන ඇලීම.

සමහර වෙලාවට හිතනවා 'නිවන් දකින්න ඕනෑ, ඒක හොඳයි නමුත් අපි කට්ටිය ඔක්කොම එකට නිවන් දකින්න ඕනෑ' කියලා. එහෙම හිතෙන්නේ කරුණාව මුල් කරගෙනද මෛත්‍රිය මුල් කරගෙනද නැත්නම් බැඳීම මුල් කරගෙනද? එහෙම හිතෙන්නේ බැඳීම මුල් කරගෙනයි. කට්ටිය ඔක්කෝම එකට නිවන් දකින්න ඕනෑ කියලා කියන්නේ අනිත් අය අතහැරලා තනියම යාගන්න බෑ කියන එකයි. ඒ අය අතහැරෙන්නේ නෑ. අනිත් අය හිතට තදින් බන්ධනය වෙලා තිබෙන්නේ. ඒකයි එහෙම හිතෙන්න හේතුව. අන්න ඒකටයි ආදරය කියලා කියන්නේ. ආදරය කියන්නේ බැඳීම.

ඇත්ත වශයෙන්ම අපි නිවන ගැන දන්නේ අහලා විතරයි. අපිට නිවන ගැන හැඟීමක් තිබෙනවා. බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙන ධර්මයට අනුව අපි හිතාගෙන ඉන්න නිවනක් තිබෙනවා. අහගෙන හිතාගෙන ඉන්න ඒ නිවනට කියනවා **අනුමාන නිවන** කියලා. ඒක නිසා නියම විදියට නිවනේ තිබෙන ඇත්ත සැපය අපිට දැනෙන්නේ නෑ. හේතුව, නිවන අපිට ප්‍රත්‍යක්ෂක් නොවන නිසා. නිවන

පිළිබඳව දක්වලා තිබෙන කරුණු කාරණාත් අපිට හරි අඩුයි. නිවන ගැන යම්තරම් අහන්න ලැබෙන කොට තමයි ඒ ගැන වැඩිපුර හිතන්න හිත පෙළඹෙන්නේ.



නිවන අවබෝධ කරගන්න නම් ඉස්සෙල්ලාම කරන්න තිබෙන්නේ නිවනට මෙහා එනම් මෙතෙර තිබෙන දේවල්, ඒ කියන්නේ චිත්ත චෛතසික සහ රූප පුළුවන් තරම් කඩලා කඩලා පොඩියටම කඩලා විශ්ලේෂණය කරලා බලන්න ඕනෑ. අපි මේවා කඩා බිඳ විභජනය කරලා බලන්නේ නැති නිසා ඒ ධර්ම වලින් හිත අහකට යන්නේ නෑ. අපි ඒවාට දීලා තිබෙන අගය වැඩියි. නිවනට අගයක් දෙන්න අපි ඒ ගැන දන්නෙත් නෑ. චිත්ත චෛතසික රූප ධර්මයන්ට අපි අගයක් දීලා තිබෙන්නේ මුලාවෙන්. ඒක නිසා ඒ ගැන ගැඹුරින් තේරුම් ගැනීමට චිත්ත චෛතසික රූප ධර්ම වෙන වෙනම කඩලා කඩලා බෙදලා බලන්න ක්‍රමයක් අපිට කියලා දෙනවා. අන්න ඒකට කියනවා විදර්ශනා කරනවා, සම්මර්ශනය කරනවා කියලා. ඒවා එකින් එකට බැදිලා තිබෙන විදිය හිතනවට කියනවා හේතු ප්‍රත්‍යය වශයෙන් බලනවා, සම්මර්ශනය කරනවා, පටිච්චසමුප්පාදය වශයෙන් බලනවා, ධාතු ස්වභාව වශයෙන් බලනවා කියලා.

අපි මේ ශරීරයට නොමනා වටිනාකම් දීලා නොමනා ආකාරයේ තිබෙන්නා වූ බැඳීම හදාගෙන තිබෙන නිසා මේ කෙරෙහි කලකිරෙන්නේ නෑ. අපිට මේක එපාවෙන්නේ නෑ. නිබ්බිදාව එන්නේ නෑ. අන්න ඒක හින්ද තමයි අපිට නිවන ගැන වැටහෙන්නේ නැත්තේ. නිස්සරණය කියලා කියන්නෙත් නිරෝධයට තමයි. නිවන් දැක්කහම හිත් පහළ වෙන්නෙත් නෑ. හිත සම්පූර්ණයෙන්ම නැතිවෙලා යනවා. සංසාරේ දිගටම ආපු එකක්වත් වැඩ කරන්නේ නෑ. විතර්ක විචාර පීති සුඛ ඒකාග්‍රතා මොකක්වත් වැඩ කරන්නේ නෑ. ඔක්කොම ටික නැතිවෙලා යනවා.

සිත තාවකාලිකව නතරවන ස්ථානයක් තිබෙනවා. ඒ තමයි නිරෝධ සමාපත්තිය. නිරෝධ සමාපත්තියට හැමෝටම සමවදින්න බෑ. නිරෝධ සමාපත්තියට සමවදින්න පුළුවන් අනාගාමීන් වහන්සේලාට සහ රහතන්වහන්සේලාට පමණයි.

මහත්මයෙක් - නිරෝධ සමාපත්තියට සමවදින්න පුළුවන් අනාගාමීන් වහන්සේලාට සහ රහතන්වහන්සේලාට පමණයි ද?

ස්වාමීන්වහන්සේ - ඔව්, ඒත් හැම අනාගාමීන් වහන්සේලාටත් හැම රහතන්වහන්සේලාටත් බෑ. නිරෝධ සමාපත්තියට සමවදින්න සමාපත්ති 8 ක් හුරුකරන්න ඕනෑ. රූපාවචර ධ්‍යාන සමාපත්ති 4

සහ අරූපාවචර ධ්‍යාන සමාපත්ති 4 සම්පූර්ණ කරන්න ඕනෑ. ඒක සම්පූර්ණ කරාට පස්සේ ඒ අටෙන් තමයි ඉහළට ඉහළට යන්නේ. පළවැනි දෙවැනි තුන්වැනි හතරවැනි පස්වැනි හයවැනි හත්වැනි අටවැනි වශයෙන් ගිහිල්ලා අටවෙනි එකෙන් උඩට යනවා කියන්නේ නිවනට යනවා කියන එක. ඒකත් සමාපත්තිය කියලා තමයි සලකන්නේ. ඒවා නැතුව යන්න අමාරුයි.

ප්‍රශ්නයක් - ස්වාමීන්වහන්ස රහතන්වහන්සේට සිත් සහ චෛතසික නෑ නේද?

පිළිතුර - රහතන්වහන්සේට සිතුත් තිබෙනවා, චෛතසිකත් තිබෙනවා. ඒක හොඳ ප්‍රවේසමෙන් තේරුම් ගන්න ඕනෑ. රහතන්වහන්සේලාට සිත් නෑ කියලා කියන්නේ නෑ, රහතන්වහන්සේලාට චෛතසික නෑ කියලා කියන්නේත් නෑ, රහතන්වහන්සේලාට පහළ වෙන්නේ නැති සිත් ටිකක් නම් තිබෙනවා. රහතන්වහන්සේලාට අකුසල් සිත් පහළ වෙන්නේ නෑ. රහතන්වහන්සේලාට අකුසල් චෛතසික පහළ වෙන්නෙත් නෑ. රහතන්වහන්සේලාට පහළවෙන්නේ ක්‍රියා සිත්.

ධ්‍යාන සමාපත්ති අටක් උපදවාගෙන ඉන්න රහතන්වහන්සේට ඒක හුරු කරහම ඒක පුරුදු කරහම ඒ හුරුව නිසා නිරෝධ ගත වෙන්න පුළුවන්. රහතන්වහන්සේ අධිෂ්ඨාන කරලා නිරෝධ සමාපත්තියට විනාඩි 15 සමවැදුනොත් ඒ වෙලාවේ උන්වහන්සේට සිතුත් චෛතසිකත් මුකුත් නෑ. නමුත් ඒක ඒ විනාඩි 15 තුල පමණයි. අධිෂ්ඨාන කළ කාලය ඉවර උනහම නැවත සිත් හට ගන්නවා.

ප්‍රශ්නයක් - ස්වාමීන්වහන්ස නිරෝධ සමාපත්ති අවස්ථාවේ සහ නිවන අතර වෙනස මොකක්ද?

පිළිතුර - නිවන විඳීම් වශයෙන් ගත්තොත් එක සමානයි. වෙනස තමයි පිරිනිවන්පෑවට පස්සේ හිතත් නෑ චෛතසිකත් නෑ. ශරීරයත් නෑ. නිරෝධ සමාපත්තියේදී හිතත් නෑ චෛතසිකත් නෑ නමුත් ශරීරය තිබෙනවා.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස රහත්ඵල සමාපත්තියයි නිරෝධ සමාපත්තියයි කියන දෙක වෙනස්ද?

පිළිතුර - ඔව්, ඒ දෙක වෙනස්.

මේ පුද්ගලයා නිවන අරමුණු කරනවා. එතකොට හිත වැඩ කරන්නේ නෑ. ඒක නිසා චෛතසිකත් නෑ. ඒකට කියනවා නිරෝධ සමාපත්තිය කියලා. නමුත් ශරීරය පමණක් තිබෙනවා. විනාඩි 15වක්ද පැයක්ද දෙකක් ද දවසක්ද අධිෂ්ඨාන කළේ ඒ අදිෂ්ඨාන කළ කාල පරිච්ඡේදයේ පමණයි ඒ සිත නැවතිලා තිබෙන්නේ. ඊට පස්සේ සිත් නැවතත් ඇතිවෙනවා.

ඵල සමාපත්තියේදී චිත්ත චෛතසික වැඩ කරනවා. සෝවාන් පුද්ගලයා නිවන දකින්නේ සෝවාන් පුද්ගලයාගේ මටමටයි. අපි හිතමු මේ අනාගාමීන්වහන්සේ කෙනෙක් කියලා.මේ අනාගාමීන් වහන්සේ නිවන් දකින්නේ අනාගාමීන්වහන්සේගේ මට්ටමටයි.මේ අනාගාමීන්වහන්සේ නිවන අත්විඳින්න සමාපත්තියක් හදාගන්නවා. එතකොට නිර්වාණ ඵලය අරමුණු කරන සිත් පහළ වෙනවා. ඒවාට කියනවා ලෝකෝත්තර සිත් කියලා. ඒ ලෝකෝත්තර සිත් වලින් නිවන අරමුණු කරමින් නිවනේ තිබෙන ශාන්තිය විඳින්න වේදනාව අවශ්‍යයි. ඒකනිසා වේදනාව තිබෙනවා. සිතුත් අවශ්‍යයි. ඒක නිසා සිතුත් පහළ වෙනවා. නිරෝධ ස්මාපත්තියේදී නිවන අරමුණු කරන සිත් නෑ. නමුත් නිවී පවතිනවා.

ඇත්තටම හිතක් පවතිනවා කියලා කියන්නේ හිත දැල්විලා තිබෙනවා කියන එකයි. භාවනා කරන්න ගිහිල්ලා ඇස්දෙක පියාගත්තම තමන් තනි වෙනවා. එතකොට බලන්න පුළුවන් සිත කොච්චර දැල්වෙනවද කියලා. සිත නවතින්නේම නෑ, දිගටම පහළ වෙනවා. සමහර දේවල් තමන්ගේ ජීවිතියට කිසිසේත්ම ආදාල නැති, ළඟ පහතක හිතලත් නැති දේවල් ඉබේම උඩට එනවා.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස රහතන්වහන්සේලා නිරෝධ සමාපත්තියටත් ඵල සමාපත්තියටත් දෙකටම සමවදින වෙලාවල් තිබෙනවද?

පිළිතුර - මෙහෙම තිබෙනවා, බුදුරජාණන්වහන්සේට නිරෝධ සමාපත්තියට සමවදින්න හොඳට පුළුවන්. සමහර අවස්ථාවලදී බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙනවා "මම මේ දවස්වල දිගටම සුඤ්ඤතා විමොක්ෂයෙන් වැඩ වාසය කරනවා" කියලා. සුඤ්ඤතාවය කියන එක මම මේ විදියට කියන්නම්.

වාහන ගත්තට පස්සේ Cambridge කියලා තිබෙනවා Austin කියලා තිබෙනවා Toyota, Honda Suzuki කියලා වාහන ජාති තිබෙනවා. දැන් මේ වාහන ඉස්සරහ නවත්වලා තිබෙනකොට ඒ වාහනය ඔය වගේ සංඥාවකින් තමයි අපි හඳුනා ගන්නේ. ඒවගේම තමයි ඔය වාහනවල තිබෙනවා පිට තහඩු සහ ඒ තහඩුවල පාට. ඔය තහඩුවයි පාටයි නිසා වාහනයේ අභ්‍යන්තරය වහලා තිබෙන්නේ. ඒක අපිට නිතර වැටහෙන්නේ නෑ. පේන්නේ නෑ. ඔය Toyota Honda Suzuki කියන සංඥා ටිකට අපි ගාම්භීර අගයන් ගාම්භීර වටිනාකම් ප්‍රදානය කරලා තිබෙන්නේ. සංඥාවයි ඒවාට දීලා තිබෙන වටිනාකම් අගයන් මත තමයි අපේ හිත ඒකෙ එල්ලිලා තිබෙන්නේ. එවගේම තමයි අපි වාහනයක් දිහා බැලුවට ඒකෙ අභ්‍යන්තරය අපිට පේන්නේ නෑ. දැන් ඔය වාහනයේ පාට වෙච්ච හැඩවත් වෙච්ච glass එක දාලා තිබෙන ලොකුවට පිම්බිලා තිබෙන්නා වූ සම්පූර්ණ කොටස තමයි අපි හිතින් value එකක් දීලා අල්ලා ගන්නේ.

දැන් බලන්න ඔය වාහන වල සංඥාවල් හරිම තදයි. ඒ හැඩයයි පාටයි ඒකට දීලා තිබෙන අගයයි ඔක්කොම ටික එක්ක අපේ හිත තදින්ම ඒක අල්ලලා තිබෙනවා. ඇත්තටම බැලුවහම ඔය තහඩු ටික දොරවල් ටික ගලවලා වෙන් කරහම ටයර් ටික ගලවලා වෙන් කරහම nuts ටික ගලවලා වෙන් කරහම

glass ටික ගලවලා අයින් කරහම wheels ටික වෙන්කරලා පැත්තකින් තිබ්බහම ඇතුලේ තිබෙන seats ගලවලා වෙන් කරහම nuts ගොඩක් තිබෙනවා, තහඩු ගොඩක් තිබෙනවා glass ගොඩක් තිබෙනවා, steering wheel එකයි ඒකට සම්බන්ධ ඒවා වෙනම තිබෙනවා. ඒවගේ ඔක්කෝම ටික වෙන වෙනම තිබ්බොත් එහෙම අපි අර හදාගත්ත Nissan Suzuki කියන වාහන සංකල්පය එන්නේ නෑ. අර කෑලි ඔක්කොම එකට ගත්තහම තමයි අපිට තේරෙන්නේ ඒක මහා ලොකු දෙයක් කියලා. මේ සියල්ලම බෙදලා බෙදලා ගත්තහම තිබෙන්නේ වාහනයක් නොවෙයි. තිබෙන්නේ කාර් වල කොටස් කීපයක්. එතකොට අපි ඇලුම් කරපු ආසා කරපු වටිනා කම දීපු වාහනය එතන නෑ. අපි අර ඉස්සෙල්ලා වාහනයක් කියලා තදින් සිතින් ගත්තු දේ එතන නැති නිසා අපි කියනවා ශූන්‍යයයි කියලා. හැබැයි වාහනය ශූන්‍ය උනාට ඒ වාහනේ කියලා ඇළුම් කරන්න හේතු වෙච්ච තහඩු ඇන nut කෑලි ටික පමණක් තිබෙනවා.

ඒවගේ මේ ජීවිතය ගත්තහමත් ඔය විදියමයි. මේ කොණ්ඩය, මේ ඇස් දෙක, කන් දෙක, නාසය, මේ තොල් පොටවල්, නිකට, දෙකම්බුල්, උරහිස, ඇඳුම් පැළඳුම් කියන මේ ඔක්කොම ටික එකට අරගෙන ඒවාට සත්ව සංඥාව වද්දගෙන තිබෙන්නේ. ඒ සත්ව සංඥාවට තමයි අපි ඇලුම් කරන්නේ. ඒ සත්ව සංඥාවට තමයි අපි අගයන් දීලා තිබෙන්නේ. ඒ සත්ව සංඥාවට තමයි අපි වටිනා කම දීලා තිබෙන්නේ. ඒක නිසා මේ ටික අපි ධාතු වශයෙන් කොටස් කරගමන්ම එහෙමත් නැත්නම් කෙස් ලොම් නිය දත් ආදී වශයෙන් කොටස් කරගමන්ම නැත්නම් පඨවි ආපෝ තේජෝ වායෝ විඤ්ඤාණ ආකාස වශයෙන් ධාතු ස්වභාවයෝ කියලා වෙන්කරපු ගමන් අර සත්වයා කියන කෙනා ශූන්‍යයයි.

ආන්න ඒ වගේ බුදුරජාණන්වහන්සේ සත්වයෙක් නැති ජීවයකුත් නැති ආත්මත් නැති සත්ව පුද්ගල නැති Toyota ත් නැති නිකම්ම ධර්ම ස්වභාවයෝ පමණක් තිබෙනවා කියලා තේරුම් ගත්තා. ආන්න ඒකට කියනවා ශූන්‍යතාවයෙන් වැඩ වසනවා කියලා. නිර්වාණය කියන්නේ ශූන්‍යතත්වයේ පරම ශූන්‍යත්වය.

මේකට මම තව කාරණයක් කියන්නම්. අපි හිතමු අපි Benz එකක් අරගෙන මේ ශාලාවේ ගලවනවා කියලා. Benz වාහනේ තිබෙනවා අමුතු ආනුභාව සම්පන්න ගතියක්. ඒ සලකුණ නිසා ඒ නම නිසා ඒකෙ අමුත්තක් හිතට දැනෙනවා. දැන් ඔය වාහනේ ගැලෙව්වහම ඒකෙ තිබෙන තහඩු nuts engineඑක වගේ කෑලි ඔක්කොම ගැලෙව්වට පස්සේ අර Benz කියන සංකල්පය අපේ හිතින් අහකට යනවා. ඒක ශූන්‍යයයි. Benz සංකල්පය එතැන නෑ. නමුත් ඒක Benz එකක් හැටියට සංකල්පයක් හැදෙන්න Benz එකක් හැටියට යම්කිසි සිතුවිල්ලක් මතුවෙන්න Benz එකක් හැටියට සංඥාවක් පැල වෙන්න හේතු වෙච්ච, උපකාර වෙච්ච් යකඩ ටිකක් නම් තිබෙනවා. නමුත් දැන් Benz සංකල්පය නෑ. දැන් අපි ඒ බඩු ටිකත් ශාලාවෙන් අයින් කරලා දානවා. එතකොට දැන් මොකක්වත්ම මේකේ නෑ. දැන් එතැන Benz එකකුත් නෑ, Benz එකක් හැදෙන්න තිබෙන්න බඩු කට්ටලෙත් නෑ. එතකොට තිබෙන්නේ බඩුත් නැති මුකුත්ම නැති ශූන්‍යතාවයක්.

දැන් මේ ජීවිතයේ හිසේ සිට පාදාන්තය තෙක් ඇතුලත පිටත බැලුවහම එතැන සත්වයෙක් නෑ. පුද්ගලයෙකුත් නෑ. ආත්මයක් ජීවයක් මුකුත්ම නෑ. නමුත් ආත්මයක් ජීවයක් සත්වයෙක් පුද්ගලයෙක් කියලා හිතාගන්න උපකාරවෙච්ච පඨවි ආදී ධර්ම කට්ටලයක් තිබෙනවා. ඒ ටිකෙන් තමයි මේක හදාගත්තේ. දැන් මේ පඨවි ආදී කොටසුත් චිත්ත චෛතසිකත් සියල්ලම අයින් කරාට පස්සේ සත්ව සංඥාවකුත් නෑ, හැඟීමකුත් නෑ, ඒවගේ හැඟීමක් පහළ කරගන්න හේතුවන ධර්ම කොට්ඨාසයකුත් නෑ. එතකොට ඒක පරම ශූන්‍යයයි. නිවනත් ඔන්න ඔය වගෙයි. නිවනේ සත්වයෙක් කියලා පාවිච්චියට ගන්න පුළුවන් රූප කෑලිත් නෑ. ශූන්‍යයයි. විඤ්ඤාණ කෑලිත් ඒකෙ නෑ. ශූන්‍යයයි. චෛතසිකත් නෑ ශූන්‍යයයි. ඒක නිසා නිර්වාණ ධාතුව සත්ව පුද්ගල සංඥාව හදාගන්න හේතුවන නාම රූප ධර්මයන්ගෙන් ශූන්‍ය නිසා ඒක පරම ශූන්‍යයයි. ඔන්න ඔය විදියයි.

මේ ශූන්‍යත්වය දැනෙන්න විපස්සනා කරලා ඉහළටම යන්න ඕනැ. ශූන්‍යයයි කියලා කියන්නෙම විදර්ශනා ඥානයමයි.

දැන් මේ ශූන්‍යතාවය කියන එක බාහිර වස්තුවකින් තමයි අපි ගලවලා ගත්තේ. **Benz** කාර් එක බාහිරයි. බාහිර දේවල් ශූන්‍යයයි කියලා දැනගන්න ලේසියි. හේතුව එතැන ‘මම’ නෑ. මේ ‘මම’ කියලා ගන්න දේට දීලා තිබෙන මාමායනය හරි වැඩියි. මේකට කාවැදිලා තිබෙන සත්ව සංඥාව හරි වැඩියි. ඒක අරින්න අමාරුයි, හැබැයි පුළුවන්.

දැන් මේ ශරීරයට **Benz** එකට කරපු වැඩේම කරලා බලන්න. ඒක ක්‍රම කීපයකට කරන්න පුළුවන්. මේක කොටස් කරන්න පුළුවන් පරම ධාතු ස්වභාව හැටියට. සත්ව සංඥාව නැති වී යන කොටස් කිරීම් අතර කෙස් ලොම් නිය දත් සම් මස් ඇතුලාන්තයේ තිබෙන නහර ඇට, ඇට මිදුළු ඊළඟට **organs** වශයෙන් ගත්තහම වකුගඩුව අක්මාව දළඹුව හදවත පිත්තාශය ආදී මේ ඔක්කෝම ටික ගලවලා ගලවලා ගත්තහම අපි සුන්දරත්වයෙන් බලපු, පැහැදිලි ගතියෙන් බාර ගත්ත කෙනා එතැනදී ශූන්‍ය වෙලා යනවා.

අපි හිතන්නේ නැති එකකුත් එතැන තිබෙනවා. ඒ තමයි ඇට සැකිල්ලක් අපේ ඇඟ ඇතුලේ තිබෙනවා. හැබැයි අපේ ඇට සැකිල්ල අපි දැක්කොත් ඒ සැකිල්ලටත් අපි බය වෙනවා. නමුත් ඒක ඇතුලේ තිබෙනවා. අපි භයවන අපි භයකරන මේ ඇට සැකිල්ල නිසා තමයි අපිව බිමට මිරිකෙන්නේ නැතුව තිබෙන්නේ. හිස් කබල නැත්තම් එහෙම මේ හැම එක්කෙනාගේම මුණු ටික ටයර් වගේ පල්ලෙහාට මිරිකිලා තිබෙන්නේ. හරියට කියනවානම් අපේ අම්මලා කැවුම් හදනකොට ඉතුරු වෙච්ච පිටි නිකන් වක්කරනවා. ඒවා නිකන් රොටි වගේ. මේ හිස් කබල නැත්නම් අපිටත් ආන්න ඒවගේ එකක් වෙනවා. මේ ඇට සැකිල්ල නිසා තමයි අපේ කඳ උඩට පිහිටලා තිබෙන්නේ. ඒක අයින්කරොත් එහෙම සම්පූර්ණ ශරීරයම ගුලියක් වගේ පහළට බහිනවා. මේ තමයි දෙතිස් කුණප වශයෙන් මේ ශරීරය දිහා බලන එක විදියක්. මේ විදියට බෙදුවට පස්සේ මෙයාද මේ හිටපු එක්කෙනා කියලා අපිටම අමුත්තක් දැනිලා පුද්ගල සංඥාව නිකම්ම නිකම් ඇස් ඉස්සරහපිට කඩා වැටෙනවා.

අනිත් එක තමයි ධාතු වශයෙන් බෙදීම. ධාතු වශයෙන් බෙදාගෙන බෙදාගෙන යනවා. ඒ ධාතු වශයෙන් බෙදන්නේ මේ ජීවිතයයි. මේ ශරීරයයි ඒ ශරීරය ගැන හිතන හිතයි දෙකම කඩලා දානවා. දෙකම කොටස් කරනවා. එතකොට මේ ශරීරයයි ඒ ගැන සිතන සිතුවිල්ලයි ඒ සිතන චෛතසිකයි ඔක්කොම ටික ශූන්‍යයයි. එතැනත් චිත්ත චෛතසික රූප ටිකක් එක්තරා හැඩයකට සකස් වෙලා ක්‍රියාත්මක වන හැඩ තලයක් පමණයි තිබෙන්නේ.

දැන් මේක හොඳට හිතන්න. ‘නිර්වාණයත් ධර්මයක්ලු’. එහෙම තමයි අපි අහලා තිබෙන්නේ. එතකොට මේ ජීවිතය කියලා කියන්නෙත් ධර්ම ස්වභාව ටිකක්ලු. අපිට එහෙම අහන්න ලැබුණහම අපි ඒක පස්සේ ගිහිල්ලා දවසක ප්‍රත්‍යක්ෂයෙන්ම අවබෝධ කරගන්නවා ඒක ‘ලු’ නෙමෙයි එහෙමම තමයි කියලා.

දැන් එතකොට මෙතැන සත්වයෙකුත් නැති, ජීවියෙක් කියලා හිතාගන්න දේකුත් නැති, මම කියලා හිතාගෙන හිටපු පුද්ගලයෙකුත් නැති මේ ඇට සැකිල්ලකටයි මස් හම කෙස් ලොම් දත් ආදී **set** එකකට අර **Suzuki** වගේ නමක් තියාගෙන තිබෙනවා රණසිංහ කියලා. මේ රණසිංහ කියන නම දාගත්තේ ධර්ම කොට්ඨාසයකට. අවසානයේදී කොහොම හරි මෙයා නිවනුත් දැක්කා. නිවන කියන්නේ ධර්මයක්. පුද්ගලයෙක් නොවෙයි. එතකොට මේ ශරීරය කියන තැනත් පුද්ගලයෙක් ආත්මයක් නෑ. එතකොට ‘එහෙම නම් කවුද නිවන් දැක්කේ’ කියලා හිතෙනවා.

ඇත්තටම ගැඹුරානත්යෙන් බැලුවහම සත්වයකුත් නොවෙයි නිවන් දැකලා තිබෙන්නේ පුද්ගලයෙකුත් නොවෙයි නිවන් දැකලා තිබෙන්නේ, වෙලා තිබෙන්නේ ධර්මයක් විසින් නිර්වාණ කියන ධර්මය අවබෝධ කර ගැනීමක් පමණයි.

ප්‍රඥාව කියන්නා වූ ඒ පිරිසිදු දැකීම් බැලීම් සංඛ්‍යාත වූ ඒ ධර්ම ස්වභාවය විසින් අසංඛත ධාතු සංඛ්‍යාත ධර්මය දැකලා තිබෙනවා. එහෙම උනාට පස්සේ එහා පැත්තෙත් සත්වයෙක් නෑ, මෙහා පැත්තෙත් සත්වයෙක් නෑ. අවසානයේදී වෙන්නේ ධර්මයක් විසින් ධර්මයක් දැකීමක් පමණයි. එතැනට යනකම් අපි 'මම භාවනා කරනවා' 'මම තපස් රකිනවා' කියලා මේ ටික කියාගෙන තමයි යන්නේ. නමුත් අවසානයේදී සත්වයෙක් නෑ කියලා තේරුම් ගන්නකොට වෙලා තිබෙන්නේ සත්වයෙක් නොවෙයි නිවන් දැකලා තිබෙන්නේ. ලෝක ව්‍යවහාරයේ හැටියට ස්කන්ධ ගොඩක් තිබෙන නිසා ඒ සමූහයෙන් වෙන් කරලා හඳුනා ගැනීම සඳහා නමකුයි 'සත්ව' කියන වචනයකුයි භාවිතා කරා හැරෙන්න වෙලා තිබෙන්නේ ධර්ම ස්වභාවයක් තවත් ධර්ම ස්වභාවයක් දැන ගැනීමයි.

හේතු ඵල හැටියට ක්‍රියාත්මක වන ධර්ම කට්ටලයක් හේතු ඵල නැති ධර්මයක් තේරුම් ගත්තා. එහා පැත්තේ හේතු ඵල ධර්ම නෑ, මෙහා පැත්තේ හේතු ඵල ධර්ම සමූහයක් තිබෙනවා. ඔන්න ඕක තමයි වෙන්නේ.

නිරෝධය වන කොට ඔය සත්ව සංඥාව සම්පූර්ණයෙන්ම ගැලවිලා යනවා. සත්ව සංඥාව දාගෙන හිටපු කොටස් ටික තේරුම් අරගෙන ඒකට තිබෙන ඇලීමත් සම්පූර්ණයෙන්ම ගැලවිලා යනවා.

හිතලා බලන්න අපිට තණ්හාවක් ලෝභයක් රමණීය පියකරු මනස්කාන්ත ගතියක් තිබෙන්නේම පිම්බිලා තිබෙන කොටයි. ඒක නැති වෙච්ච ගමන් ඒ ඇලීම නැති වෙලා යනවා. අපේ හිත නිතර හුරු කරන්න ඕනෑ බොරුවක් එක්ක රසාස්වාදයක් විඳින්නේ නැතුව ඉන්න. ඒකට කියනවා නෙක්ඛම්මය කියලා. ඒ කියන්නේ හැම වෙලාවේම බොරුවට මවාගත්ත බොරුවට කියාපාගත්ත දේක තමයි හිත රමණය වෙන්නේ. ඒකෙ හිත ගිලගෙන ගිහිල්ලා කාගෙන ඒක හිතින් අල්ලාගෙන විඳිනවා. ඒකට තව වචනයක් පාවිච්චි කරලා තිබෙනවා රාගය කියලා. රාගය කියලා කියන්නේ ලස්සනයි කියලා ලොකුවට පුම්බාගෙන ඒක විඳින එක. සිතින් රංජනයවන ගතියට කියනවා රාගය කියලා. බොරුවේ රසාස්වාදනය කරන්න යන්න හොඳ නෑ. ඒකෙන් හැම වෙලේම අයින් වෙන්න ඕනෑ. ඒකට කියනවා නික්මෙනවා බොරුවෙන් අයින් වෙනවා කියලා.

අද මේ මාතෘකාව හරිම ගැඹුරුයි.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස පේන්නේ ප්‍රඥාවට නම් ඒකත් නැතිවෙලා යනවද?

පිළිතුර - ඔව් නැතිවෙලා යනවා. එහෙම තමයි. කණ්ණාඩියක් කැඩුනහම ඒකෙ පෙනෙන ගතිය කෝ? හිතලා බලන්න, කණ්නාඩියට නම් පේන්නේ ඒ පෙනෙන ගතිය පිහිටලා තිබෙන්නේ කණ්නාඩියේ. කණ්ණාඩිය බිඳුණට පස්සේ පේන ගතිය තව දුරටත් නෑ. අන්න ඒ වගේ සිත තිබෙනකොට තමයි සිතේ බැහැගෙන සිත ආධාර කරගෙන තමයි ප්‍රඥාව තිබෙන්නේ. සිත නිවී ගියානම් නැවතුනා නම් ප්‍රඥාව නැවත එන්න විදියක් නෑ. ඒක තමයි ස්වභාවය.

තව එකක් තිබෙනවා. හිතලා බලන්න, දැන් ප්‍රඥාව නෑ. නිකං සිත තිබෙනවා. ප්‍රඥා මූලය තිබෙනවා. දැන් අපි කරන්න යන්නේ නැති ප්‍රඥාවක් ඇති කරගෙන නැති ප්‍රඥාවක් පැල කරගෙන පැල වෙච්ච ප්‍රඥාව වඩාගෙන (**grow** කරගෙන) ඒ **grow** වෙච්ච ප්‍රඥාව හොඳට වැඩි කරලා වැඩි කරලා ඊට පස්සේ

ඒකෙන් අවශ්‍ය ටික ඔක්කොම දැකලා බලලා ඒ ප්‍රඥාව හැදිච්ච තැනයි ඒ ප්‍රඥාව ආශ්‍රය කරපු ආශ්‍රිතයොයි ඔක්කොම ටික දාලා අයින්වෙන එක. බුදුරජාණන්වහන්සේ සර්වඥ්ඥතා ඥානයටවත් ඇලුනේ නෑ කියලා කියනවා. ඒක ඒ තරම්ම ගාම්භීරයි. ඒවගේම හරිම සුන්දරයි, හරිම ප්‍රණීතයි, හරිම ශාන්තයි, හරි සූක්‍ෂමයි. මේ වගේ බලන බැලිල්ලට මෙනෙහි කිරීමට කියනවා ශූන්‍යතාවය දකිනවා කියලා.

හොඳයි සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය සුවසේම සිද්ධ වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි